

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2022

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

© 2022 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය (3 වැනි මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

Info@erd.gov.lk
http://www.erd.gov.lk

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 239

අන්තර්ගතය

- පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
- පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
- පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
- පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක
- පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
- පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ
- පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම පිළිබඳ වගකීම දරණ ප්‍රධානම රජයේ දෙපාර්තමේන්තුව වන අතර එය මුදල් අමාත්‍යාංශය යටතේ වන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක වේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව්දෙනෙකු යටතේ පාලනය වේ. 2022 වසරේ දී අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අංශ හා ඒකක ක්‍රියාත්මක විය.

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- පෙරදිග ආසියානු අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීන හා ආසියානු යටිතල පහසුකම් හා අයෝජන බැංකු අංශය
- මැද පෙරදිග, දකුණු ආසියානු රටවල් හා චක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අංශය
- දියුණු ආර්ථික අංශය
- තාක්ෂණික ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
- ණය කළමනාකරණ අංශය
- අංශ සම්බන්ධීකරණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- තොරතුරු තාක්ෂණ ඒකකය

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනය සඳහා සම්පත් ඒකරාශී කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වන විශ්ව දැනුම, පරිචය, ප්‍රවීණතාවය හා සුදුසු කොන්දේසි යටතේ විදේශීය සම්පත් සපයා ගැනීම සඳහා මූලාශ්‍ර සැපයීම මෙන්ම කාරක ප්‍රාග්ධන හා රටේ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා දේශීය අරමුදල් සම්පාදනය කිරීම.

අරමුණු

- සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විදේශීය සම්පත් උචිත කොන්දේසි යටතේ ඒකරාශී කිරීම
- දෙපාර්තමේන්තුව මඟින් මූලාශ්‍රය සපයන ලද සම්පත් වඩාත් හොඳින් උපයෝජනය කිරීම සඳහා විධායක හා ක්‍රියාත්මක ආයතනයන්ට පහසුකම් සැලසීම
- චිතෙර ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථා ඵලදායී අන්දමින් චක් රැස් කිරීම මඟින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායකවීම
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී මෙන්ම කාර්යක්ෂම ලෙස ඉටු කිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් සවිමත් කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- සංවර්ධන සහාය උපායමාර්ග හා ප්‍රමුඛතා හඳුනාගැනීමට සංවර්ධන පාර්ශ්වකරුවන් හා මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම
- එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන් වාර්ෂිකව ශ්‍රී ලංකා රජය වෙත ලබාදීමට නියමිත විදේශ මූල්‍යයන්ට අදාළ වැඩසටහන්වල ක්‍රියාකාරකම් රේඛීය අමාත්‍යාංශ/ ආයතන හා සමඟ සම්බන්ධීකරණය කිරීම
- රේඛීය අමාත්‍යාංශ/ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එක්ව විදේශ මූල්‍යයනය සඳහා ව්‍යාපෘති පෙළගැස්මක් පිළියෙල කිරීම
- විදේශාධාර ලබාදෙන විදේශීය දූත කණ්ඩායම් වල ක්‍රියාකාරකම් තත්ත්ව ගවේෂී අදියරේ සිට ඇගයීම් අදියර දක්වා සම්බන්ධීකරණය කිරීම
- විදේශ ආධාර පිළිබඳ සම්මුති සාකච්ඡා පැවැත්වීම හා ණය/ ප්‍රදාන ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම සහ එම ගිවිසුම බලාත්මක කිරීම සඳහා පහත කාර්යයන් වල නිරත වීම
    - සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙනු ලබන නියෝජිතායතන සමඟ සම්මුති සාකච්ඡා පැවැත්වීම
    - ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් රජයේ අනුමැතිය හා අධිකාරී බලය ලබා ගැනීම
    - ක්‍රියාත්මක නියෝජිතායතන සමඟ උප ණය ගිවිසුම් අත්සන් කිරීම
    - ණය ගිවිසුම් බලාත්මක වීමට අවශ්‍ය පූර්ව කොන්දේසි සම්පූර්ණ කිරීම

- විදේශීය ණය/ ප්‍රදාන මඟින් මූල්‍යයනය කරනු ලබන ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරිත්වය සොයා බැලීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වීම;
    - සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සමාලෝචන දූත කණ්ඩායම්වල කටයුතු සම්බන්ධීකරණය හා නිර්දේශිත පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම
    - විදේශීය මූල්‍යයනය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය සඳහා රේඛීය අමාත්‍යාංශ මඟින් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටු සඳහා සහභාගිවීම හා සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ එකතුව ව්‍යාපෘති ක්‍රියාත්මකවීම පිළිබඳ ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම;
- තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන විදේශ පුහුණු අවස්ථා කළමනාකරණය කිරීම
- පහත සඳහන් ක්‍රියාකාරකම් මඟින් විදේශ රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා සහායදීම
    - පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා ණය කළමනාකරණ පද්ධතිය (CS-DRMS) හරහා රජයේ විදේශ ණය කළඹ පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම

    - ණය ගෙවීමේ කොන්දේසි සහ ගිවිසුම් පිළිබඳ අදාළ තොරතුරු ඇතුළත් කිරීම
    - ණය/ ප්‍රදාන චකඟතා, ප්‍රතිලබ්ධි, පොලී හා වාරික ගෙවීම්, විනිමය අනුපාතික, විචල්‍ය පොලී අනුපාත සහ අදාළ සාර්ව ආර්ථික දත්ත ඇතුළත් කිරීම
- නියමිත වේලාවට ගෙවීම් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ උපදෙස් ලබාදීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ අනෙකුත් තීරණ ගැනීමේ සහාය පිණිස විදේශ ණය සේවා පුරෝකථන දත්ත ලබාදීම
- ගිණුම්කරණය සහ ප්‍රකාශන සඳහා අදාළ ආයතන වෙත ණය දත්ත බෙදාහැරීම
- ලෝක බැංකුව හා අන්තර්ජාතික මූල්‍ය අරමුදල වෙත කාර්තුමය සහ වාර්ෂික පදනම්න් විදේශ ණය දත්ත වාර්තා කිරීම
- මහජන භාවිතය සඳහා සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ විදේශ ණය පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම
- දත්ත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ අවස්ථානෝචිතව ණය දත්ත ප්‍රතිසන්ධානය කිරීම
- අවශ්‍ය පරිදි ණය දත්ත විශ්ලේෂණය කිරීම

- කාරක ප්‍රාග්ධන හා රටේ සංවර්ධන අවශ්‍යතා සඳහා දේශීය අරමුදල් සම්පාදනය
- සියලු විදේශීය මුල්‍යයන ව්‍යාපෘතිවලට අදාළව, රජයේ වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම

1.4. සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අ.අ.ජ (ද්‍රව්‍යාර්ථමය මූලය)
අ.අ.ජ (බහුපාර්ශ්වීය හා ශිල්පීය ආධාර)
අ.අ.ජ (ණය හා ආයෝජන පර්යේෂණ)
අ.අ.ජ. (ප්‍රාග්ධන වෙළඳපොල, ආයෝජන හා දියුණු කාර්මික)
අධ්‍යක්ෂ. වීමා හා ආයෝජ යටිතල පහසුකම් හා පාලන
අධ්‍යක්ෂ. මැදපෙරදිග, දකුණු ආසියාව හා අප්‍රිකා ජාතීන්
අධ්‍යක්ෂ. නැගෙනහිර ආසියාව
අධ්‍යක්ෂ. බහුපාර්ශ්වීය මූල්‍ය අරමුදල
අධ්‍යක්ෂ. ආසියාව සංවර්ධන බැංකු
අධ්‍යක්ෂ. ද්විපාර්ශ්වීය ආධාර
අධ්‍යක්ෂ. ණය කළමනාකරණ
ගණකාධිකාරී/ ස.අ (මුළු)
අධ්‍යක්ෂ. අංශ සම්බන්ධීකරණ
අධ්‍යක්ෂ. ප්‍රාග්ධන වෙළඳපොල හා ආයෝජන
අධ්‍යක්ෂ. දියුණු කාර්මික
ස.අ/නි.අ
ප.නි
නො.කා.නි
නො.කා.නි
සංවර්ධන නිලධාරී - 21
කළමනාකරණ සේවා නිලධාරී - 42
ශ්‍රාරම්භක ශ්‍රේණියේ නිලධාරීන් - 30
අ.අ.ජ - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ස.අ/නි.අ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
ප.නි - පරිපාලන නිලධාරී
නො.කා.නි - කාර්යාල සහායිකා නිලධාරී

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. හැඳින්වීම හා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව වර්තමානයේදී පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. අවම වශයෙන් රටේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන විදේශ විනිමය ප්‍රමාණය වුවද හිඟවීමත් සමඟ, ණය තිරසාරත්වය ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව අන්තර් කාලසීමාවක් සඳහා ඇතැම් ද්වීපාර්ශ්වික සහ වාණිජ ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත් අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය සහිතව විස්තීරණ අරමුදල් පහසුකමක් හරහා ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ වැඩසටහනට අනුකූල වන පරිදි එම ණය නියමිත පරිදි ක්‍රමානුකූලව ප්‍රතිව්‍යුහගත කිරීමට අපේක්ෂා කරනු ලබයි. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සිදු කෙරුණු පුළුල් සාකච්ඡාවලින් පසුව, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ 2022 සැප්තැම්බර් මාසයේදී කාර්යමණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළැඹිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මෙම විස්තීරණ අරමුදල් පහසුකම් සැපයීමේ වැඩසටහනට එළඹීමත් සමඟ වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් ශ්‍රී ලංකාව වෙත අමතර විදේශ අරමුදල් ලබාගැනීමට ඇති හැකියාවද ඉහළ යනු ඇත.

2022 අප්‍රේල් 12 වැනි දින මෙම අතුරු ණය ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කිරීමත් සමඟම, බහුතර ද්වීපාර්ශ්වික ණයහිමියන් ප්‍රමාණයක් අදාළ සංවර්ධන ව්‍යාපෘති සහ වැඩහටහන්වල උපයෝජනය සඳහා විදේශ ප්‍රතිලබ්ධි ලබාදීම අත්හිටුවන ලද අතර, ඉහත සඳහන් කළ ප්‍රතිපත්ති නිවේදනය මඟින් ආවරණය නොවන බහුපාර්ශ්වික ණය හිමියන් සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකරනු ලැබීය. ඒ අනුව, ද්වීපාර්ශ්වික ණය වල වාර්ෂිකව උපයෝජනය සඳහා විදේශ මූල්‍ය ප්‍රතිලබ්ධි ලබාදීම සහ නව මූල්‍ය එකඟතා අඩු වූ අතර, ඒ හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති සඳහා බහුපාර්ශ්වික ණයහිමියන්ගෙන් ලද ඇතැම් මූල්‍ය පහසුකම්වලින් කොටසක් අයවැය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා යොදාගත් අතර, 2022 වර්ෂයේදී සිදුවූ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඉහළ අගයක් ගැනීමට එවැනි පියවරයන් උපකාරී විය. තවද, ඉන්දියානු රජයෙන් ලද ඒ.ජ.ඩොලර් මිලියන 500ක සහ ඒ.ජ.ඩොලර් මිලියන 1,000ක හදිසි ණය මාලාව, ඉන්ධන සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා වූ විදේශ මූල්‍යයන අවශ්‍යතා සැලකිය යුතු ලෙස සපුරා ගැනීමට උපකාරී විය.

2.2. ප්‍රගතිය - 2022

2.2.1. විදේශ මූල්‍යයන එකඟතා

2019 සිදුවූ පාස්කු ප්‍රහාරය සහ 2020-2021 කාලය තුළ කොවිඩ් -19 වසංගතය හේතුවෙන් විනිමය රට තුළට ගලා ඒම අඩුවීමෙන් ඇති වූ අහිතකර බලපෑමෙන් ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා රජය 2020 වර්ෂය ආරම්භයේදී ගත් ක්‍රියාමාර්ග අභිබවා, 2022 දී කල්පිරීමට නියමිතව තිබූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ 2022 පළමු කාර්තුවේ සිට විනිමය අනුපාත ඉහළයාමෙන් ආර්ථිකයට ඇති වූ පීඩනය ඉහළයාම හේතුවෙන් රජයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහන සමඟ ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා 2022 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කළ අතුරු ණය ප්‍රතිපත්තියට අනුව බලපෑමට ලක් වූ ණය සේවාකරණය නතර කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සිදුවූ අතර, එය කෙටි කාලීනව වෙළඳපොළට ප්‍රවේශය තවදුරටත් වසා දැමුවද අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ප්‍රධාන වශයෙන් ඉන්දියාවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් නිල සංවර්ධන ආධාර ලැබීම හේතුවෙන් 2022 වර්ෂයේදී අවශ්‍ය විදේශ මූල්‍යකරණ බැඳීම් සුරක්ෂිත කර ගැනීමට රජයට හැකි විය. රජය, විවිධ විදේශ සංවර්ධන

පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමඟ 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී විදේශ මූල්‍යයන චකඟතා ගිවිසුම් 15ක් මඟින් ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 1,915.20ක චකඟතා ඇතිකර ගෙන ඇති අතර මෙය ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 1,805.5ක ණය පහසුකම් හා ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 109.7ක පූර්ණ ප්‍රදාන පහසුකම් වලින් සමන්විත වේ.

මෙම කාලපරිච්ඡේදය තුළදී ඉන්දියාව ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 1,555ක විදේශ මූල්‍යයන චකඟතා වලින් පෙරමුණ ගෙන සිටින අතර, ඉන් පසුව පිළිවෙලින් ආසියානු සංවර්ධන බැංකුව (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 203), ඇමරිකා එක්සත් ජනපදය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 73), කුවේට් රාජ්‍ය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 32.9), ජර්මනිය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 17.6), යුරෝපා සංගමය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 13.9), කොරියාව (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 12) හා ජපානය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 7.8) සමඟ විදේශ මූල්‍යයන චකඟතා ඇති කර ගෙන ඇත.

2022 වර්ෂයේදී වෙළඳ අංශය සඳහා ඉහළම විදේශ මූල්‍යයන චකඟතා ලැබී ඇති අතර, එය ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 1,000ක් හෝ සමස්ත විදේශ මූල්‍යයන චකඟතාවලින් සියයට 52ක් වූ අතර, විදුලිබල හා බලශක්ති අංශය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 500ක් සියයට 26ක්) සහ මානුෂීය ආධාර අංශය (ඇ.ඩො.ජ.ඩොලර් මිලියන 203ක් හෝ සියයට 10) වශයෙන් බෙදී ගොස් ඇත.

වගුව - 1 විදේශ මූල්‍යයන චකඟතා 2022, සංවර්ධන පාර්ශ්වකරු (ඇ.ඩො.ජ.ඩො. මිලියන)

සංවර්ධන පාර්ශ්වකරු	ප්‍රමාණය (ඇ.ඩො.ජ.ඩො. මිලියන)		
	ණය	ප්‍රදාන	එකතුව
ද්විපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගිතා	**1,605.5**	**92.8**	**1,698.3**
ඉන්දියාව	1,555.0	-	1,555.0
ඇමරිකා එක්සත් ජනපදය		73.0	73.0
කුවේට්	32.9	-	32.9
ජර්මනිය	17.6		17.6
කොරියාව		12.0	12.0
ජපානය		7.8	7.8
බහුපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගිතා	**200.0**	**16.9**	**216.9**
ආසියානු සංවර්ධන බැංකුව	200.0	3.0	203.0
යුරෝපා සංගමය	-	13.9	13.9
එකතුව	**1,805.5**	**109.7**	**1,915.2**

රූපසටහන 1 - විදේශ මූල්‍යයන එකඟතා 2022, සංවර්ධන පාර්ශ්වකරු (ඇ.ඒ.ජ.ඩො. මිලියන)



මූලාශ්‍රය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

රූපසටහන 2 - විදේශ මූල්‍යයන එකඟතා 2022, ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඒ.ජ.ඩො. මිලියන)



මූලාශ්‍රය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

වගුව 2 : 2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතා, අදාල මූල්‍ය කොන්දේසි සමග

සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය	ණය හෝ ප්‍රදානය	එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය	ව්‍යාපෘතිය හෝ වැඩසටහන	එකඟතා ප්‍රමාණය (මිලියන)				මූල්‍ය කොන්දේසි				වෙනත් කොන්දේසි	
				විනිමය	අත්සන් කරන ලද විනිමයෙන්	රුපියල්	ඇ.එ.ජ. ඩොලර්	පොලිය			වෙනත් ගාස්තු	සහන කාලය (වර්ෂ)	පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ)
								වර්ගය	වාර්ෂික අනුපාතය (සියයට)	සීමාන්තිකය (පදනම් අංක සියයට)			
ද්විපාර්ශ්වික													
කුවේට්	ණය	2022.02.03	මොරටුව විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ඉදිකිරීම හා උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය	කුවේට් ඩිනාර්	10.0	6,638.9	32.9	ස්ථාවර	1	අදාළ නොවේ	පොරොන්දු ගාස්තු 0.5%	5	25
ජර්මනිය	ණය	2022.01.27	මාතර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා මූල්‍යාධාර ලබාගැනීම	යුරෝ	15.7	3,561.6	17.6	ස්ථාවර	2	අදාළ නොවේ	-	10	30
ඉන්දියාව	ණය	2022.02.02	කෙටි කාලීන ණය මාලාව	ඇ.එ.ජ.ඩො.	500.0	100,710.3	500.0	විචල්‍ය	SOFR Daily Compound	1.5	කළමනාකරණ ගාස්තු 0.5% පොරොන්දු ගාස්තු 0.5%	1	1.5
	ණය	2022.03.17	2022 අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය	ඇ.එ.ජ.ඩො.	1,000.0	267,862.1	1,000.0	විචල්‍ය	SOFR 3M	1.6	පෙර ගෙවීම් ගාස්තු 0.5% **නීති ගාස්තු ඇ.ඒ.ජ.ඩො. 3,500**	3	4
	ණය	2022.06.10	රසායනික පොහොර මිලදී ගැනීම සඳහා කෙටි කාලීන ණය මාලාව	ඇ.එ.ජ.ඩො.	55.0	19,789.0	55.0	විචල්‍ය	SOFR Daily Compound	2	පොරොන්දු ගාස්තු 0.5% ; කළමනාකරණ ගාස්තු 0.5%	3	3
ඇමරිකා එක්සත් ජනපදය	ප්‍රදාන	2022.08.31	ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම හා ජනජීවිතය සමෘද්ධිමත් කිරීමේ ආධාර වැඩසටහන	ඇ.එ.ජ.ඩො.	65.0	23,474.6	65.0	අදාළ නොවේ					3
	ප්‍රදාන	2022.12.16	USAID දේශගුණික විපර්යාස අනුවර්තනය කිරීමේ ව්‍යාපෘතිය	ඇ.එ.ජ.ඩො.	8.0	2,905. 4	8.0	අදාළ නොවේ					3
කොරියාව	ප්‍රදාන	2022.09.28	ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල කොවිඩ් - 19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම	ඇ.එ.ජ.ඩො.	6.0	2, 177. 4	6.0	අදාළ නොවේ					3
	ප්‍රදාන	2022.10.18	ශ්‍රී ලංකාවේ TVET වෘත්තීය ව්‍යාපෘතිය	ඇ.එ.ජ.ඩො	6.0	2,180.3	6.0	අදාළ නොවේ					3
ජපානය	ප්‍රදාන	2022.04.04	ශ්‍රී ලංකාවේ ශාක ස්වස්ථතා සහතිකකරණය වැඩිදියුණු කිරීම තුළින් කෘෂි නිෂ්පාදන අපනයන ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම	ජපන් යෙන්	500.0	1, 337. 4	3.7	අදාළ නොවේ					2

	ප්‍රදාන	2022.08.18	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා ආධාර ප්‍රදානය කිරීම	ජපන් යෙන්	500.0	1, 267. 7	4. 1	අදාළ නොවේ						2
බහුපාර්ශ්වික														
ආසියානු සංවර්ධන බැංකුව	**ණය**	2022.09.09	ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි ආධාර ව්‍යාපෘතිය	ඇ.එ.ජ.ඩො.	200.0	72,400.0	200.0	විචල්‍ය	SOFR	0.7	පොරොන්දු ගාස්තු 0.15%	8		32
ආසියානු සංවර්ධන බැංකුව	ප්‍රදාන	2022.09.09	ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි ආධාර ව්‍යාපෘතිය	ඇ.එ.ජ.ඩො.	3.0	1,086.0	3.0	අදාළ නොවේ						2
යුරෝපා සංගමය	ප්‍රදාන	2022.12.16	සමාජ සහජීවනය සහ සාමය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SCOPE)	යූරෝ	8.0	3, 096. 6	8.5	අදාළ නොවේ						3
	ප්‍රදාන	2022.12.16	හරිත ප්‍රතිපත්ති සංවාද පහසුකම් ව්‍යාපෘතිය (GPDF)	යූරෝ	5.0	1, 935. 4	5.4	අදාළ නොවේ						3
එකතුව						**510, 422.7**	**1,915.2**							

මූලාශ්‍රය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන - එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් ඇ.එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේදී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.

2.2.2. විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා, සංවර්ධන ව්‍යාපෘති වල උපයෝජනය පිණිස ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.එ.ජ.ඩොලර් මිලියන 2,400.9කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ.එ.ජ.ඩොලර් මිලියන 2,390.7ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර ඇ.එ.ජ.ඩොලර් මිලියන 10.2ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි වේ.

2022 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධි වලින් ඉහළම ප්‍රමාණය ඉන්දියාව සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් මඟින් ලබාගත් අතර, එය සමස්ථයෙන් ආසන්න වශයෙන් සියයට 38ක් ද අනතුරුව ඉහළම ප්‍රමාණයක් ආසියානු සංවර්ධන බැංකුව (සියයට 31) සහ ලෝක බැංකුව (සියයට 19) සමඟ අත්සන් කරන ලද ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

වගුව - 3: 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි සංවර්ධන පාර්ශ්වකරු අනුව

සංවර්ධන පාර්ශ්වකරු	ප්‍රතිලබ්ධි *(ඇ.එ.ජ.ඩො. මිලියන)		
	ණය	ප්‍රදාන	එකතුව
ද්විපාර්ශ්වික	**1,151.5**	**3.5**	**1,155.0**
ඉන්දියාව	925.5	-	925.5
ජපානය	75.6	-	75.6
චීනය	65.4	-	65.4
ප්‍රංශය	35.8	-	35.8
නෙදර්ලන්තය	24.1	-	24.1
සෞදි අරාබිය	8.6	-	8.6
කුවේටය	5.6	-	5.6
හංගේරියාව	2.9	-	2.9
කොරියාව	3.1	1.8	4.9
එක්සත් රාජධානිය	2.0	-	2.0
ඔස්ට්‍රියාව	1.4	-	1.4
ස්පාඤ්ඤය	1.2	-	1.2
ඩෙන්මාර්කය	0.3		0.3
ජර්මනිය	-	1.7	1.7
බහුපාර්ශ්වික	**1,239.2**	**6.7**	**1,245.9**
ආසියානු සංවර්ධන බැංකුව	740.7	0.8	741.5
ලෝක බැංකුව	450.2	5.9	456.1
ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව	35.9	-	35.9
ඔපෙක් අරමුදල	6.3	-	6.3
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල	6.1	-	6.1
එකතුව	**2,390.7**	**10.2**	**2,400.9**

මූලාශ්‍රය - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සටහන - එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඇ.එ.ජ.ඩොලර් බවට හැරවීමේදී 2022 දෙසැම්බර් 31 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.

**තාවකාලික අගයයන්*

එක් එක් සංවර්ධන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස, මෙම වර්ෂයේ සිදුවූ ප්‍රතිලබ්ධි වලින් ආසන්න වශයෙන් සියයට 24ක ප්‍රමාණයක් විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇති අතර, අනතුරුව සියයට 21ක ඉහළ ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 14ක ප්‍රමාණයක් වෙළඳ අංශයේ ද, සෞඛ්‍යය හා සමාජ සුභසාධන අංශයේ සියයට 07ක ප්‍රමාණයක් ද, පිලිවෙලින් මානුෂීය ආධාර සියයට 07, ජලසම්පාදන හා සනීපාරක්ෂාව සියයට 05, ප්‍රවාහන සියයට 05, වාරිමාර්ග සියයට 04, අධ්‍යාපනය සියයට 04 සහ කෘෂිකර්මාන්ත සියයට 03 යන අංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල උපයෝජනය පිණිස යොදවා ඇත.

රූප සටහන 3 - 2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රතිලබ්ධි (ඇ.ඒ.ජ.ඩො. මිලියන)



මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
** වෙනත් = නෙදර්ලන්තය, සෞදි අරමුදල, කුවේට්, හංගේරියාව, කොරියාව, එක්සත් රාජධානිය, ඔස්ට්‍රියාව, ස්පාඤ්ඤය, ඩෙන්මාර්කය, ජර්මනිය*
*** වෙනත් = ආපදා කළමනාකරණය, පරිසරය, නිවාස සහ නාගරික සංවර්ධන, කම්කරු සහ වෘත්තීය පුහුණුව, ඉඩම් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය, වැවිලි, වරාය සහ නාවික, ග්‍රාමීය සංවර්ධනය, විද්‍යාව සහ තාක්ෂණය*

2.2.3 පළකරන ලද චකඟතා මත ඉදිරියේ දී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට පළ කර ඇති චකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන වල ශේෂය 2022 දෙසැම්බර් 31 දින වන විට ඇ.ඒ.ජ.ඩොලර් බිලියන 6.8ක් විය. මෙයින් ඉහළම ප්‍රමාණය චීනය විසින් ලබාදීමට නියමිත අතර, අනතුරුව ඉහළ ප්‍රමාණයන් පිළිවෙලින් ආසියානු සංවර්ධන බැංකුව, ඉන්දියාව, ජපානය සහ ලෝක බැංකුව විසින් ලබාදීමට නියමිතය.

චකඟතා පලකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ශේෂයෙන් සියයට 20ක ප්‍රමාණයක් මාර්ග හා පාලම් අංශයේ ද, සියයට 18ක ප්‍රමාණයක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව අංශයේ ද, සියයට 12ක ප්‍රමාණයක් ප්‍රවාහන අංශයේ ද චකඟතා පළ කරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

වගුව 4 – 2022 දෙසැම්බර් 31 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධිවීමට නියමිත ශේෂය - ප්‍රධාන ආර්ථික අංශ අනුව

ආර්ථික අංශය	එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනයවීමට නියමිත ශේෂය (ඇ.ඒ.ජ.ඩොලර් මිලියන)
මාර්ග හා පාලම්	1394.1
ජල සම්පාදන හා සනීපාරක්ෂාව	1209.1
ප්‍රවාහනය	831.8
වෙළඳ	660.0
අධ්‍යාපනය හා පුහුණු	471.7
සෞඛ්‍යය හා සමාජ සුභසාධනය	345.0
විදුලිබල හා බලශක්ති	307.8
වාරිමාර්ග	279.5
නිවාස හා නාගරික සංවර්ධනය	241.9
කෘෂිකර්මාන්තය	202.8
වෙනත්	874.9
එකතුව	**6,818.6**

මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

තාවකාලික

වෙනත් = ආරක්ෂක, ආපදා කළමනාකරණය, පරිසරය, යුක්තිය, කම්කරු සහ වෘත්තීය පුහුණුව, ඉඩම් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය, මාධ්‍ය, වරාය සහ නාවික, ග්‍රාමීය සංවර්ධනය, විද්‍යාව සහ තාක්ෂණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන , ක්‍රීඩා සංවර්ධනය

රූපසටහන 4 – 2022 දෙසැම්බර් 31 වන විට පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධිවීමට නියමිත ශේෂය - එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඒ.ජ.ඩො.මිලියන)



මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

2.2.4 විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය

2022 දෙසැම්බර් 31 වන විට රජය විසින් ලබාගත් විදේශ ණය මූල්‍යයනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඒ.ජ.ඩොලර් බිලියන 35.9[1] කි.

රූපසටහන 5 – 2022 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය (ඇ.ඒ.ජ.ඩො. මිලියන)



මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීම් සහ කාලීන ණය පහසුකම් ඇතුළත් වාණිජ ණය මධ්‍යම රජයේ මුළු විදේශ ණය වලින් සියයට 41ක බහුතර ප්‍රමාණයක් නියෝජනය කරන අතර, ඉතිරිය පිළිවෙලින් ද්විපාර්ශ්වික ණය (සියයට 31) සහ බහුපාර්ශ්වික ණය (සියයට 28) මඟින් නියෝජනය වේ.

මධ්‍යම රජයේ මුළු විදේශ ණයවලින් සියයට 37ක් ඉදිරි වසර පහ තුළ කල්පිරීමට නියමිත අතර, සියයට 51කට ආසන්න ප්‍රමාණයක් ඉදිරි වර්ෂ 6-20 කින් ද, සියයට 12ක් ඉදිරි වර්ෂ 20කින් පසුව ද කල්පිරීමට නියමිතය. තවද,

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[2] ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 1,955.7කි. මෙයින්, ඇ.ඒ.ජ.ඩොලර් මිලියන 1,456.3ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඒ.ජ.ඩො.මිලියන 499.4ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

[1] තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළුව ඇති මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.

[2] *ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම*

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 අප්‍රේල් 12 වන දින සිට ආරම්භ වන පරිදි අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 අප්‍රේල් 12 දින සිට දෙසැම්බර් 31 දින දක්වා නොගෙවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩ.ජ.ඩො.මිලියන 1,849ක්ද, පොලී ප්‍රමාණය ඇ.ඩ.ජ.ඩො.මිලියන 842ක්ද විය. මෙම නොගෙවූ ණය පිළිබඳව ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී අදාළ ණයහිමියන් සමඟ සාකච්ඡා කිරීමට රජය විසින් පියවර ගනු ඇත.

නම: D.A.P. අබේසේකර

තනතුර: අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

අත්සන: .....

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

3 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූලික කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 Rs.		සටහන	තත්‍ය 2022 Rs.	2021 Rs.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,773,453,650	1,343,113,026	ඒසීඒ - 3
-	තැන්පතු		45,435	226,546	ඒසීඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		7,708,550	9,544,181	ඒසීඒ - 5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් (අ)		848,780,301	65,092,830	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,626,987,936**	**1,417,976,583**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඇ) -අ)+(ආ)		**2,626,987,936**	**1,417,976,583**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**17,357,578**	**3,651,468**	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ) -ඇ)-(ඇ)**		**2,612,630,358**	**1,414,325,115**	
-	**අඩු කළා :වියදම් පුනරාවර්තන වියදම්**				
104,735,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5		87,263,011	ඒසීඒ - 2(ii)
65,034,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6		31,972,083	
168,249,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7		351,925,061	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
338,018,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**232,796,894**	**457,490,801**	

	මූලධන වියදම්				
4,300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	1,342,655	1,833,770	**ඒසිඒ - 2(ii)**
75,72,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	7,257,170	11,433,933	
1,540,206,525	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	1,540,022,232	858,681,061	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**13**	-		
849,455,301	හැකියා වර්ධනය	**14**	849,454,724	65,341,723	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
2,401,533,826	**මුළු මූලධන වියදම් (උ)**		**2,398,076,781**	937,290,487	
	තැන්පතු ගෙවීම්		45,435	226,546	**ඒසිඒ - 4**
	අත්තිකාරම් ගෙවීම්		5,393,012	9,157,821	**ඒසිඒ - 5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**5,438,447**	**9,384,367**	
	මුළු වියදම් ඒ = (ඊ+උ+ඌ)		2,636,312,122	1,417,835,009	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ) = (ඉ) – (ඒ)		(23,681,746)	(3,509,894)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(23,681,746)	(3,509,894)	**ඒසිඒ - 7**
			-	-	**ඒසිඒ - 3**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		(23,681,746)	(3,509,894)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	182,081,925	180,166,353
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	18,451,833	20,767,370
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**200,533,758**	**200,933,723**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,451,833	20,767,370
දේපළ පිරියත හා උපකරණ සංචිතය		182,081,925	180,166,353
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**200,533,758**	**200,933,723**

පිටු අංක 7 සිට 24 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරවි කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	සහකාර අධ්‍යක්ෂ (මුදල්)
නම: කේ.එම්.මහින්ද සිරිවර්ධන	නම : ඩී.ඒ.පී අබේසේකර	නම : එන්.ඩබ්.කේ.සී බුද්ධිකා
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 21/02/2023
දිනය : 21/02/2023	දිනය : 21/02/2023	

කේ.එම්.එම්. සිරිවර්ධන
ලේකම් සහ මුදල් ආර්ථිකානුවර්තන සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය 2
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

එන්.ඩබ්.කේ.සී. බුද්ධිකා
සහකාර අධ්‍යක්ෂ
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022	**2021**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	873,403,116	70,066,778
	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	1,773,453,650	1,253,995,076
අත්තිකාරම් අයකර ගැනීම්	7,311,647	7,743,125
තැන්පතු ලැබීම්	226,546	226,546
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,654,213,848**	**1,421,149,475**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		118,978,093
සහනාධාර සහ මාරුකිරීම්		351,925,061
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		20,000
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		3,561,468
අත්තිකාරම් ගෙවීම්		9,057,820
තැන්පතු ගෙවීම්	45435	88,285
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**256,137,066**	**483,858,988**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(අ)-(අ)-(ආ)	**2,398,076,782**	**937,290,487**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උප ණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-

අඩුකළා : මූදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,398,076,782	937,290,487
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,398,076,782**	**937,290,487**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)-(ඈ)-(ඉ)	**(2,398,076,782)**	**(937,290,487)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)-(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මූදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)-(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) - (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනමෙම

1) වාර්තාකරණ කාල පරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමෙන් කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	_____	_____අදාල නොවේ_____			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	341,040,000	338,018,000	232,796,894	68.8%
ප්‍රාග්ධන	1,262,825,000	2,401,533,826	2,398,076,781	99.8%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	_____	_____	_____අදාල නොවේ_____		_____	

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී හිඟුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ		156,734,996.73		
9153	ඉඩම්			-	
9154	අස්පෘශ වත්කම්		9,446,928.97		
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්		15,900,000.00		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන 2022 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ය නිමැවුම		
	90% - 100%	**75% - 89%**	**50% - 74%**
මූල්‍ය ඵලදායිතා	100.3		
මූල්‍ය උපයෝජන	115.7		
තාක්ෂණික පුහුණු අවස්ථාවන් (නිලධාරීන් ගණන)*	111.9		

** සටහන:*වසංගත තත්ත්වය අවසන් වී ඇති බැවින් 2022 දී පෙර වැඩසටහන් සියල්ල ERD වෙත ලැබෙනු ඇතැයි උපකල්පනය කර ඇත*

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	ඇ.ඒ.ජ.ඩො. මිලියන 733.23	ප්‍රතිලාභී හෝ දායක රට සැපයුම් මාදිලිය (නිල සංවර්ධන ආධාර, සෘජු විදෙස් ආයෝජන හෝ වෙනත් සැපයුම්) අනුව සංවර්ධනය සඳහා වන සමස්ත සම්පත් ගලනය ලද ප්‍රමාණය: ඇ.ඒ.ජ.ඩො. මිලියන 932.82			127
සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණ ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ඇ.ඒ.ජ.ඩො. මිලියන 1082.5	යටිතල පහසකම් සඳහා වන සමස්ත නිල ජාත්‍යන්තර සහාය (නිල සංවර්ධන ආධාර සහ වෙනත් නිල වශයෙන් ලැබෙන සැපයුම්) ලද ප්‍රමාණය :ඇ.ඒ.ජ.ඩො. මිලියන 1451.80			134
පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	පුහුණු අවස්ථා 1500*	ක්ෂේත්‍රය සහ ඉගෙනුම් ආකාරය අනුව, ශිෂ්‍යත්ව සඳහා නිල සංවර්ධන ආධාර ගලා යාමේ ප්‍රමාණය ලැබුණු අවස්ථා ගණන - 1,679			112

** සටහන: වසංගත තත්ත්වය අවසන් වී ඇති බැවින් 2022 දී පෙර වැඩසටහන් සියල්ල ERD වෙත ලැබෙනු ඇතැයි උපකල්පනය කර ඇත*

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් වාර්ෂික විදේශ අරමුදල් ලබාදීම සිදුකරන අතර එය මුළු එකඟතා ලෙස සටහන් කර ගනී. රේඛීය අමාත්‍යාංශ මඟින් කෘෂි කර්මාන්තය, වාරිමාර්ග, නිපුණතා සංවර්ධන, අධ්‍යාපනය, දරිද්‍රතාව පිටුදැකීම, මාර්ග හා මහාමාර්ග, නාගරික සංවර්ධන හා සෞඛ්‍යය වැනි විවිධ අංශයන්හි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම එකඟ වූ අරමුදල් උපයෝජනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, පරිසර නිෂ්කාශනය, ඉඩම් අත්පත්කර ගැනීම, උපයෝගිතා සේවාවන් ප්‍රතිස්ථාපනය කිරීම, නැවත ස්ථානගත කිරීම හා නැවත පදිංචි කිරීම, තක්සේරු කිරීම හා ප්‍රසම්පාදනය වැනි ව්‍යාපෘති සූදානමට සම්බන්ධ ගැටළු හේතුවෙන් උපයෝජනයන් සැලසුම් කළ පරිදි සාක්ෂාත් කර ගත නොහැකි වේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	43	37	6
තෘතීයික	3	3	0
ද්විතියික	64	55	9
ප්‍රාථමික	31	26	5

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් විවිධ නියමයන් හා කොන්දේසි මත සහ අමාත්‍ය මණ්ඩලය, මහ බැංකුවේ මුදල් මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ජනාධිපති ලේකම් කාර්යාලය ආදියෙන් නිසි අනුමැතිය ඇතිව විදේශ සම්පත් ඒකරාශී කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ෂාත් කරගැනීම සඳහා සම්මුති සාකච්ඡා පැවැත්වීමේ කුසලතා, භාෂා කුසලතා සහ ආර්ථික විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යානය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාවට නැංවීම, ණය කළමණාකරණය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආදී විෂය ක්ෂේත්‍රයන්ගේ වැඩකිරීමට මනා දැනුමක් සහිත කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. පුහුණුව ලත් නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රමය හරහා වෙනත් ස්ථානවලට මාරු කරන අතර, එම පුරප්පාඩු වෙනත් ස්ථානවලින් මාරුවීම් ලැබ පැමිණෙන නිලධාරීන්ගෙන් පුරවනු ලැබේ. මෙලෙස වාර්ෂික ස්ථාන මාරුවීම් හරහා පැමිණෙන නිලධාරීන් අතුරින් අවශ්‍ය කෙරෙන කුසලතා සහ දැනුමෙන් සමන්විත නිලධාරීන් සොයා ගැනීම ඉතා අසීරු අතර, එම නිලධාරීන් පුහුණු කිරීමට දෙපාර්තමේන්තුවට අවම වශයෙන් වසර දෙකක්වත් ගතවේ. මෙය දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යක්ෂමතාවයට බලපායි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
1. ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව - 2022	27	දින17	ගාස්තු නොමැත		දේශීය	ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
2. රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩමුළුව	01	**2022** පෙබරවාරි**9,10**	**රු.7,000/-**		දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම

3.	SA 2**2.23:** සාර්ව මූල්‍ය විශ්ලේෂණය සහ ප්‍රමාණාත්මක ක්‍රම	02	**2022** ජුනි 12 – 18		**රු. 9,189.40**	විදේශීය	සාර්ව මූල්‍ය විශ්ලේෂණය සහ ප්‍රමාණාත්මක ක්‍රම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම
4.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය	02	**2022 ජූලි 11 - 22**		**රු. 19,761.50**	විදේශීය	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
5.	කියවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණය	01	**2022 අගෝස්තු 18**	**රු.7,750/-**		දේශීය	කියවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
6.	රාජ්‍ය ණය කළමනාකරණය සහ ණය තිරසාරභාවය පිළිබඳ පුහුණු පාඨමාලාව **-** NEDA	02	**2022** සැප්තැම්බර් **12 17 -**		**රු. 179,525.28**	විදේශීය	රාජ්‍ය ණය කළමනාකරණය සහ ණය තිරසාරභාවය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
7.	තිරසාර සංවර්ධනය සඳහා දේශගුණ මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	01	**2022** ඔක්තෝම්බර් **02 – 06**		ව්‍යාපෘතිය මඟින් වියදම් දරණ ලදී	විදේශීය	තිරසාර සංවර්ධනය සඳහා දේශගුණ මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
8.	රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන	01	**2022** ඔක්තෝම්බර් **12,13,14**	රු**18,000** ./-		දේශීය	රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම
9.	සම දේශගුණික අභියෝග සහ ආතති මූල්‍ය පිළිබඳ පරීක්ෂණ ආසියා සහ පැසිෆික් කලාපය සඳහා ඉගෙනුම් සම්මන්ත්‍රණය	01	**2022** දෙසැම්බර් **05-08**		රු. 60,375.56	විදේශීය	සම දේශගුණික අභියෝග සහ ආතති මූල්‍ය පරීක්ෂණ පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ		ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් උපදෙස් විමසා ඇත
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට වලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නිලධාරියාගේ යැපෙන්නන් පිලිබඳ නීතීමය ගැටළු මෙතෙක් අවසන් වී නොමැති බැවින්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය තීරණ අනුව මරණ පාරිතෝෂිතයේ හිමිකාරීත්වය පිළිබඳ තීරණයකට එළැඹීමෙන් අනතුරුව අදාළ මරණ පාරිතෝෂිත ගෙවීමට අනුමැතිය ලබාදෙන බවත්, එසේ අනුමැතිය ලැබීමෙන් පසුව රජයට අයවිය යුතු ණය ශේෂ කපාහැරීමට හැකියාව ලැබෙන බවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දෙන ලදි	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	චම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම - 1

இணைப்பு - 1

Annexure - 1

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීපීඩී/ඒ/ඊආර්ඩී/එෆ්ඒ/2022/13 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරි

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් සාම්ප්‍රදායිකව සිදු කරන පරිදි ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා

යොදවා නොගත යුතු බව දක්වා තිබුණද, වැය විෂයයන් 13 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.7,451,000 ක ප්‍රමාණයක් සියයට 0.42 සිට සියයට 440 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණි.

(ආ) වැය විෂයය අංක 239-1-1-1505 (සම්මාදම් හා දායක මුදල්) ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.174,000,000 වූ අතර, අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් සියයට 44.5 ක ප්‍රමාණයක්, එනම් රු.7,451,000 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 11 ක් අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු රු.103,809,754 ක ඉතිරියක් පැවති අතර, එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 92 අතර පාරසයක ප්‍රතිශතයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

2018 අගෝස්තු 11 දින මියගිය නිලධාරියෙකුගෙන් හා 2021 ජුලි 20 දින සේවය අතහැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.428,726 ක ණය ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.

2.3 බැඳීම් හා බැරකම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) හි කිසිදු බැරකමක් දක්වා නොමැති නමුත් විගණනයට ඉදිරිපත් කරන ලද 2023 ජනවාරි හා පෙබරවාරි වවුචර් පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාල රු.468,221 ක බැරකම් හා බැඳීම් පැවති බව නිරීක්ෂණය විය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 හි (3)(X) ඡේදය ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ මාණ්ඩලික නිලධාරීන් වෙත ලබා දෙනු ලබන ණය පහසුකම් 2022 වර්ෂය අවසන් වන තෙක් අත්හිටුවිය යුතු බවට දක්වා ඇති නමුත්, එම චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් මාණ්ඩලික නිලධාරීන් එක් අයෙකුට රු.169,825 ක ආපදා ණය ලබා දී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පවතින CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය ණය සේවාකරණ පුරෝකතන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියක් බවත් ඒ අනුව ණය පිළිබඳ දත්ත ITMIS වෙත මාර්ගගත ක්‍රමයට යොමුකිරීම පිළිබඳව අදාල ආයතන සමඟ සාකච්ඡා සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කලද, තාක්ෂණික ගැටළු හේතුවෙන් දැනට CS-DRMS පද්ධතිය ITMIS සමඟ සම්බන්ධ කිරීම දුෂ්කර කාර්යයක් වී ඇති බවත් විගණනයට දන්වා තිබුණි. ණය කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගණුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත වූ ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව 2023 මැයි මාසය අවසන් වන විටත් ක්‍රියාකර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

සංවර්ධන පාර්ශවකරු	ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව 2022	සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම 2022	විචලනය	විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු වේ ප්‍රතිශතයක් ලෙස
	එ.ජ.ඩො. මිලියන	එ.ජ.ඩො. මිලියන	එ.ජ.ඩො. මිලියන	සියයට
ලෝක බැංකුව	482	456.2	(25.8)	(5)
ආසියානු සංවර්ධන බැංකුව	550	741.4	191.4	35
චීනය	-	101.3	101.3	
ජපානය	-	75.7	75.7	
කොරියාව	-	4.9	4.9	
පෙරදිග ආසියානු රටවල්	50	21.4	(28.6)	(57)
දකුණු ආසියානු රටවල්	835	925.5	90.5	11
රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල්	150	76	(74)	(49)
එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන	8	11.1	3.1	39
එකතුව	2,075	2,413.5	338.5	

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2022 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,075 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො. මිලියන 2,413.5 ක් වීම හේතුවෙන් තත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො. මිලියන 338.5 කින් එනම්, සියයට 16 කින් පමණ වැඩි වී තිබුණි.

(ii) ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව චීනයෙන්, ජපානයෙන් හා කොරියාවෙන් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු නොකළද, සත්‍ය ණය ගැනීම පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 101.3, එ.ජ.ඩො. මිලියන 75.7ක් හා එ.ජ.ඩො. මිලියන 4.9ක අගය වී තිබුණි.

(iii) ආසියානු සංවර්ධන බැංකුවෙන්, දකුණු ආසියානු රටවල් හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන යන රටවල් වලින් ලබා ගත් ණයවල සත්‍ය උපලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 35, 11 සහ 39 කින් වැඩි වී තිබුණි.

(iv) ලෝක බැංකුව, පෙරදිග ආසියාතික රටවල් සහ රුසියාව, ඕස්ට්‍රේලියාව හා බටහිර රටවල්වලින් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය පිළිවෙළින් සියයට 5, 57 සහ 49 කින් අඩු වී තිබුණි.

(ඇ) CS-DRMS ණය කළමනාකරණ පද්ධතියේ අන්තර්ගත දත්ත නොසැසඳීම්

(i). ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් එකතුව රු.1,803,456 සෘන ණය ශේෂයන් රජයේ මූල්‍ය ප්‍රකාශන වල සහ CS-DRMS 2000+Report 854-1 වාර්තාවෙහි නිරීක්ෂණය විය.

(ii). ණය ගිවිසුම් හතරක් සම්බන්ධයෙන් එකතුව රු.652,634,243 ක සෘන ණය උපලබ්ධිවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන වල සහ CS-DRMS 2000+Report 854-1 වාර්තාවේ දක්වා තිබුණු අතර තවත් ණය ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් එකතුව රු.154,795,691 ක සෘන ණය උපලබ්ධිවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන වල පමණක් නිරීක්ෂණය විය.

(ඇ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලයුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2022 වර්ෂය තුළ එසේ මහා

භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙනුවෙන් ව්‍යාපෘති 20 ක් සඳහා එකතුව රු.1,837,321,420 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් ප්‍රතිපාදන සලසාගෙන මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් 2017 ජුනි 28 දිනැතිව නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 ප්‍රකාරව, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සතු වාහන ලේඛනය සහ දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය සමඟ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුව සතු මෝටර් රථ 13 ක් පැවතුණ ද, ස්ථාවර වත්කම් ලේඛනයේ මගී වාහන ලෙස වටිනාකම රු.59,098,696 ක් වූ මෝටර් රථ 11 ක් සඳහා එම එක් එක් වාහනයේ මෝටර් රථ අංකය යටතේ නොදක්වා පොදුවේ අංක KN 3908 ලෙස දක්වා තිබුණි. ඒ අනුව, දෙපාර්තමේන්තුව සතු වාහන නිසි පරිදි හඳුනාගත නොහැකි බව නිරීක්ෂණය විය.

(ii) දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ ඇතුළත් WP JV-1448 සහ WP KK-5481 මෝටර් රථ දෙක අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව තුළ අන්තර්ගත කර නොතිබුණි. තවද, 2022 මැයි 30 වන දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අදාළ පිළිතුරු ලිපියේ මෙම වාහන දෙක මුදල් අමාත්‍යාංශයට භාර දී ඇති බව සඳහන් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට මුදල් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ මෙම වාහන දෙක අන්තර්ගත වී නොතිබුණි. එසේම, විගණනයට ඉදිරිපත් කරන ලද බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති වාහන පිළිබඳ විස්තර තුළ ද මෙම වාහන අන්තර්ගත වී නොතිබුණි.

(iii) 2017 ජුනි 28 දිනැති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව, කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන වාර්තාව තුළ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් රු.15,900,000 ක් වටිනා අංක WP CBI-

3566 සහ WP CBI-3567 දරන වාහන දෙක වරදවා නිදහස් වත්කම් (Own Asset) ලෙස අන්තර්ගත කර තිබුණි. කෙසේවුවත්, එය දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA-6) අනුව රු.11,045,533 ක වෙනත් යන්ත්‍ර සහ උපකරණ 2022 වර්ෂය තුළදී අපහරණය කර තිබුණි. කෙසේවෙතත්, එම අපහරණයන් සඳහා වූ නිසි අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය. තවද, මෙම අපහරණයන් තුළ අන්තර්ගත සත්‍ය අපහරණයන් හා වැරදි නිවැරදි කිරීම් නිසි ලෙස වර්ගීකරණය කර ගැනීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, වත්කම් අපහරණය හෝ වැරදි නිවැරදි කිරීම සඳහා වූ අභ්‍යන්තර පාලන විධිවිධාන ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2022 වර්ෂයේ දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 20 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6ක් පැවති අතර, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 9 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 5 ක් පැවතුණි. විස්තර පහත පරිදි වේ.

සේවක වර්ගය	අනුමත තනතුරු සංඛ්‍යාව	තත්‍ය තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු/ අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	43	37	06
තෘතියික මට්ටම	03	03	-
ද්විතියික මට්ටම	64	55	09
ප්‍රාථමික මට්ටම	31	26	05
එකතුව	**141**	**121**	**20**

බී.ඕ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට